# සුදුකබර රෝගය නිට්ටාවට සුව කර ගනිමු.

නිධන්ගත රෝග, සමට සිදුවන හානි, ප්‍රවේණිගත හේතූන්, අනපේක්ෂිත කම්පනයන්, සුව කළ නොහැකි මානසික රෝග, ආවේගශීලී බව, නිතර ඇතිවන කරදර කම්කටොලු වැනි කරුණුද මෙලනින් අඩුවීමට හේතු වේ. රෝගය වැළඳුණු පිරිමින් සහ කාන්තාවන් පරීක්ෂා කිරීමේදී රෝගය නිසා කලකිරීමට පත්ව සිටින අය ඉතා වේගයෙන් රෝගය පැතිරීමේ අවදානමට ලක්වන බව සොයාගෙන ඇත.




ප්‍රතිකාර කිරීමට පෙර ප්‍රතිකාර කිරීමෙන් පසු

**ප්‍රවේණිය**

මෙම රෝගයට ප්‍රවේණිය ද ප්‍රධාන හේතුවක් ලෙස සලකනු ලැබේ මව් පාර්ශ්වයෙන් හෝ පිය පාර්ශ්වයෙන් ආවේණිකව මෙම රෝගය හට ගැනීමට ඉඩ ඇත. බොහෝ විට තුන්වන පරම්පරාවද මෙම සුදුකබර රෝගයේ බලපෑමට ලක්විය හැකි බව සොයා ගෙන ඇත.

**ශරීරය විෂවීම**

බෙහෙත් සහ ආහාර ද්‍රව්‍යවල ආසාත්මිකතාව නිසා ශරීරය විෂ වන අවස්ථාවලදී සුදුකබර රෝගය හට ගැනීමට ඉඩ ඇත. යුනානි වෛද්‍ය ක්‍රමයද මෙම මතය පිළිගනී. ප්‍රසිද්ධ

යුනානි වෛද්‍ය ග්‍රන්ථයක් වන අල් මහාජීර් හි කතෘ ඉබ්නේ මාෂුයා සියවස් ගණනාවකට පෙර සුදු කබර රෝගය ගැන මෙසේ සඳහන් කර ඇත.

"යම් කිසිවෙකු හෝ තම ආහාරය පිණිස කිරි සමග මත්ස්‍ය ආහාරය එකට ගත් විට ඔහුට සුදු කබර හෝ හන්දිපත් වේදනාව ඇතිවුවහොත් කිසිවෙකුට හෝ දොස් පැවරිය යුතු නොවේ."

## මීයන් සපා කෑමෙන් සුදු කබර ඇති වේද?

පූසන් මීයන් සහ සර්පයින් වැනි සතුන් සපා කෑමෙන් හා එම සතුන් විසින් සපා කන ලද ආහාර අනුභව කිරීමෙන් සුදු කබර රෝගය ඇති වන බව පාරම්පරික වෛද්‍යවරුන්ගේ අදහසයි. නමුත් නවීන වෛද්‍ය විද්‍යාව මෙම මතය පිළිනොගනී. එසේ වුවත් සුදු කබර රෝගය වැළඳුණු බොහෝ දෙනෙකු පවසන්නේ පූසන් හෝ මීයන් සපා කෑමෙන් පසුව තමන්ට මෙම රෝගය වැළඳුණු බවයි.

## හිරු කිරණින් ඇතිවන අසාත්මකතාවය

අව් රශ්මය හෝ හිරු කිරණින් රත් වූ ජලයෙන් ස්නානය කිරීම මගින් සුදු පුල්ලි මතුවිය හැකි බව අරාබියානු වෛද්‍ය ක්‍රමවල සඳහන්වී ඇත. හිරු කිරණින් ද අසාත්මිකතාවය ඇති විය හැකිය. ශරීරය මත හිරු කිරණ පතිත වීමේදී කැසීමක් හෝ පලු මතුවිය හැකිය. කලක් ගතවන විට එවැනි තැන්වල සුදු පුල්ලි මතුවේ. එසේම හිරු කිරණ ජලය සමග මුසුවන විට එහි ඇති ඖෂධීය ගුණයන් විනාශ වී අසාත්මිකතාවන් ඇති විය හැකි බව එම වෛද්‍ය ක්‍රමයේ සඳහන්ව ඇත.

## අත්දැකීම් සහ විශ්වාසයන්

ශ්‍රී ලංකාව ඉන්දියාව වැනි රටවල වෙරළබඩ තීරයේ සුද කබර රෝගීන් බහුලව දැකිය හැකි වේ.

* තඹ භාජනවල දීර්ඝ වේලාවක් තබන ලද ආහාර ද්‍රව්‍ය අනුභව කිරීමෙන්ද සුදු කබර ඇති වන බවට ගම්වැසියන් අතර මතයක් පවතී.
* ගන්නා ලද ආහාර ජීර්ණය නොවූ විට ශරීරය අපිරිසිදු වේ. මෙම අපිරිසිදුවීම සෙම් හෝ රුධිරයේ සිදුවන විට සුදු කබර ඇති වේ.
* රුධිරය අපිරිසිදුවීම සහ රුධිරය ශීතලවීම නිසාද සුදු කබර ඇති විය හැකි බව සමහර වෛද්‍ය ක්‍රමවල සඳහන් වී ඇත.

මෙවැනි හේතු මත ඇතිවන සුදු කබර රෝගය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වර්ග කළ හැකිය. සමේ සුළු ප්‍රදේශයකට පමණක් බලපාන වර්ගය සහ ශරීරය පුරා පැතිරෙන වර්ගය යනු ඒ දෙවර්ගයයි.

මෙම රෝගය වැළඳුණු සමහර අයගේ සමේ පිහිටා තිබෙන රෝම සුදු පැහැයක් ගන්නා අතර තවත් සමහර අයගේ රෝම කළු පැහැයෙන් යුක්ත වේ. සමහර අයගේ සම රතු පැහැය මිශ්‍රිත සුදු වර්ණයෙන් යුක්තව හෝ ලේ පැහැයට හුරු වර්ණයකින්ද යුක්ත වේ. තවත් සමහර අයගේ සම සුදු පැහැයක් ගනී.

එක් එක් වර්ගයේ සුදු කබර රෝගයට වෙන් වෙන් වූ ප්‍රතිකාර ක්‍රම යොදා ගනු ලැබේ.

## සුදු කබර අදියරයන්

### ප්‍රථම අදියරය

මුලින් සුළු වශයෙන් යම් යම් තැන්වල පමණක් පුල්ලි වශයෙන් මතුවෙන අවස්ථාවේදීම වහාම ප්‍රතිකාර කිරීමෙන් මෙය සති කිහිපයකින් සුව කළ හැකි වේ.

### දෙවැනි අදියරය

මුල් අවස්ථාවේදීම නොසැලකිලිමත්කම නිසා ප්‍රතිකාර නොකිරීමෙන් බොහෝ තැන්වලට මෙය පැතිරිය හැකිය. මෙය සුව කිරීම සඳහා මාස කිහිපයක් ප්‍රතිකාර කළ යුතු වේ.

### තුන්වන අදියරය

දෙවැනි අදියරයේදී නිසි පරිදි ප්‍රතිකාර කිරීම අතපසු කිරීමෙන්ද නොයෙකුත් ඖෂධ වර්ග ගැනීමෙන්ද රෝගය දරුණු වේ.

මෙම අදියරේදී තරුණ අයගෙන් සියයට 90 ක පමණ පිරිසක් නිට්ටාවට සුව කළ හැකිය. වයෝවෘධ සහ බෙලහීන අයගේ මුහුණ ඇතුළු සියුම් තැන් සුව කළ හැකි වන අතර වෙනත් තැන්වලට පැතිරීම පාලනය කළ හැකිය.

සාමාන්‍යයෙන් රෝගය වැළඳුණ අයට වේදනාව හෝ කැසීමක් ඇති නොවේ. මෙම රෝගීන්ට විවේක ගැනීමද අවශ්‍ය නොවන අතර එදිනෙදා කටයුතු නිසි පරිදි කරගෙන යා හැකි වේ.

මෙවැනි සුදු කබර රෝගයද නිසි හේතුව සොයාගෙන අප්‍රමාදව ප්‍රතිකාර කිරීමෙන් මාස කිහිපයකදී සුව කළ හැකිය. මැතක සිට මෙම රෝගය සුව කිරීමෙහිලා ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සාර්ථක ප්‍රතිඵල පෙන්වා ඇත .

* සුදු කබර හට ගැනීමට හේතුව කුමක්ද?
  හේතුව සොයාගෙන පාරම්පරික ආයුර්වේද ක්‍රම මගින් ප්‍රතිකාර කළ හැකි වේ.
* සුදු කබර සුව කිරීමට බටහිර වෛද්‍ය ක්‍රමය අසමත් වේ.
* සුද කබර හට ගැනීමට හේතුවන මෙලනින් හිඟවීමට හේතුව මෙතෙක් කිසිදු විද්‍යාවකින් සොයාගෙන නොමැත .
* ඇමෙරිකානු වෛද්‍ය ප්‍රජාව විසින් සුදු කබර මත ආලේප කිරීම සඳහා වූ තීන්ත වර්ගයක් සොයාගෙන ඇත . මෙම තීන්තවලින් දින පහකට පමණක් තාවකාලිකව සුදු කබර වසා දැමීමට හැකි නමුත් එහි මිල අධික වේ.
* නවීන වෛද්‍ය විද්‍යාව විකිරණ චිකිත්සාව මගින් සුදු කබර සුව කිරීමේ උත්සාහයක යෙදී සිටී. නමුත් මෙම ක්‍රමය නොයෙකුත් අතුරු ආබාධ ඇතිවීමට හේතුවන අතර පසුකලකදී පිළිකාව පවා හට ගැනීමට ඉඩ ඇති බව පැවසේ.

# කුමක්ද මේ සුදු කබර රෝගය?

සමේ ස්වභාවික පැහැය වෙනස් වී ශරීරයේ සෑම තැනකම කුඩා ප්‍රමාණයේ සුදු පැහැති ලප හෝ දද මතුවී එය ක්‍රමානුකූලව ශරීරය පුරා පැතිරෙන තත්ත්වයට සුදු කබර රෝගය යැයි පවසන්නෙමු.

එක් එක් රටක දේශගුණය අනුව සමේ පැහැය වෙනස් වේ. අප අතරින් සමහරු කළු හා තවත් සමහරු තළෙළු පැහැය ගැනීමට හේතුව වී ඇත්තේ අපේ සමෙහි පිහිටා තිබෙන මෙලොනො සයිට නමැති සෛල මගින් ස්‍රාවය වන මෙලෙනින් නමැති වර්ණකයයි. සමට පැහැය ලබා දෙන්නේ මෙම වර්ණකයයි. මෙලනින් වර්ණකය සමේ නිෂ්පාදනය වීම අඩුවන විට සුදු කබර නමැති චර්ම රෝගය හට ගනී.

රක්ත වර්ණයෙන් යුතු අයට මෙලනින් අඩුවෙන්ද කලු පැහැයෙන් යුතු අයට මෙලනින් වැඩියෙන් ද ස්‍රාවය වන බවත් මෙය ආවේණිකව පැවත එන බවත් වෛද්‍ය විද්‍යාත්මක මතයයි.

අද බොහෝ අයට මානසික වධයක් වී ඇති සමේ පැහැපත් බවට හානි කරන සුදු කබර රෝගයට ඉංග්‍රීසියෙන් VITILIGO යැයි පවසනු ලැබේ.

සිද්ධායුර්වේදයේදී  සුදු කබර යනුවෙන් මෙය හඳුන්වනු ලබන අතර අපගේ පැරණි පුස්කොළ පොත්වල කිලාස, වාරුණ, තාරුණ හා ශ්විත්‍ර යනුවෙන් මෙය හඳුන්වා දී ඇත .

කෙසේ වුවද පොදුවේ සුදු කබර රෝගය යැයි හඳුන්වනු ලබන මෙම රෝගය පිළිබඳව වෛද්‍යවරු දැනුවත්ව සිටියද නවීන වෛද්‍ය විද්‍යාව මෙම රෝගය ඇතිවීමට හේතුව සොයාගෙන එය සුව කිරීමට අපොහොසත් වී ඇත. එයට හේතුව නවීන වෛද්‍ය විද්‍යාවේ ප්‍රමුඛයින් බහුලව සිටින බටහිර රටවලට මෙම රෝගයෙන් එතරම් බලපෑමක් ඇති නොවීමය.

දුප්පත් පොහොසත් භේදයකින් තොරව සියලු දෙනා මෙම රෝගයට ගොදුරු විය හැකිය. දේව ශාපයක් නිසා මෙම රෝගය වැළඳෙන බව සමහරුන්ගේ විශ්වාසයයි.

සෞඛ්‍ය සම්පන්න මිනිසුන්ගේ ශරීරවලද තරමක සුදු පුල්ලි ඇතිවීමට හැකිය. ඒ ගැන වහාම සොයා නොබැලුවහොත් කාලයාගේ ඇවෑමෙන් තොල්, ඇස්බැම්, ඇඟිලි, හිස, අත්, පා, මුහුණ යනාදී ශරීරයේ සියලු කොටස්වලට මෙය පැතිරේ.

මෙම රෝගයෙන් ශරීරයට කිසිදු වේදනාවක් හෝ අපහසුතාවයක් ඇති නොවුවද මෙය යම්කිසි අඩුපාඩුවක් ලෙස පැවැතීම වැළැක්විය නොහැකිය. මෙම රෝගයෙන් ශරීරයේ ලස්සන බවට හා පැහැපත් බවට හානි සිදුවීම එයට හේතුවයි.

සුදු කබර රෝගයෙන් සමහරු මානසික රෝගීන් බවටද පත් වේ. මේ නිසා සමහර අය දිවි නසා ගැනීමට පෙළඹෙති. මෙවැනි අයගේ රෝගී තත්ත්වය සහ සිත් වේදනාව නිසා රෝගය පැතිරීම උත්සන්න වනවා මිසක රෝගය සුව නොවේ. අනවශ්‍ය උපකල්පනයන්ගෙන් මිදී සතුටින් කල්ගත කිරීම තුළින් මෙම රෝගය පාලනය කළ හැකි වේ.

සුදු කබර රෝගය බෝවන රෝගයක් බවටද විවාහයෙන් පසුව රෝගය පැතිරීම උත්සන්න වන බවටද පවතින වැරදි මතයන් නිසා බොහෝ අයගේ පවුල් ජීවිත පවා අවුල් වී ඇත. ඇත්තෙන්ම සුදු කබර රෝගය පිළිකුල් සහගත හෝ බෝවන රෝගයක් නොවන බව සියලු දෙනා දැනගත යුතු වේ.

සුදුකබර රෝගය නිට්ටාවට සුව කිරීමට බටහිර වෛද්‍ය විද්‍යාව අසමත් වුවද පාරම්පරික ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙන් මෙම රෝගය නිට්ටාවට සුව කළ හැකිය.

සුදුකබර රෝගය ඇති වීමට හේතු වූ කරුණු අත්දැකීම තුළින් සහ නිසියාකාරව සොයාබලා ප්‍රතිකාර කිරීම මගින් මෙම රෝගය සුව කළ හැකිය.

## හේතු සහ ප්‍රතිකාර

සෛලවලින් මෙලනින් වර්ණකය අඩුවෙන් හෝ වැඩියෙන් ස්‍රාවය වීමට නිශ්චිත හේතු කිසිවක් නොමැති බව හා ස්වභාවයෙන්ම මෙය සිදුවන බව යම් යම් වෛද්‍ය ක්‍රමවල සඳහන්ව තිබුණද පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු මේ සඳහා වූ හේතූන් අත්දැකීම තුළින් ඉදිරිපත් කරති.

## තුන්දොස්

වා පිත් හා සෙම්හි අසමතුලිතතාවය මෙයට ප්‍රධාන හේතුවක් වේ යැයි ආයුර්වේද පාරම්පරික වෛද්‍ය ක්‍රමවල සඳහන් වේ. වාතය නිසා ඇතිවන සුදු කබර රෝගය ස්පර්ශ කිරීම මගින් හඳුනාගත හැකි වේ. මෙහි වර්ණය සමහර විට වෙනස් වේ. මෙයට ප්‍රතිකාර කිරීමේදී සමහරවිට සුළු වශයෙන් වේදනාවද ඇතිවිය හැකිය.

පිත නිසා ඇති වන සුදු කබර රෝගය සිනිඳු බවින් සහ නෙළුම් මලේ පිටත ඇති වර්ණයෙන් යුක්ත වේ. පිත නිසා ඇතිවන සමහර සුදු කබර ලප අව් රශ්මිය වදින විට සුළු කැසීමක් සහිතව රක්ත වර්ණයෙන් යුතු ලප බවට පත් වේ.

සෙම නිසා ඇතිවන සුදු කබර සුදු වර්ණයෙන් යුක්ත වේ. සමහර විට මෙවැනි රෝගීන්ගේ සම මත ලප නොපෙනෙන්නටද ඉඩ තිබේ. මෙය සුළු කැසීමකින් යුක්ත වේ.

ශ්‍රී ලංකාවේ සුදුකබර රෝගයට ගොදුරු වූ අය දස දහස් ගණනක් සිටිති. මෙම රෝගීන් තම රෝගය සුව කර ගැනීම සඳහා බටහිර ක්‍රමවල පිහිට සොයා යති. නමුත් මෙම සුදු කබර රෝගය ආයුර්වේද හා පාරම්පරික වෛද්‍ය ක්‍රමවලින් පමණක් සුව කළ හැකිය යන්න බොහෝ අය නොදන්නා කරුණක් බව ආයුර්වේද වෛද්‍ය විශේෂඥවරයෙකු වන වෛද්‍ය කලාවැව එන් නජීස්දීන් මහතා පවසයි.

පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකු වන නජීස්දීන් මහතා රජරට එක්සත් පාරම්පරික ආයුරවේද වෛද්‍ය විද්‍යාලය, ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය මණ්ඩලය වැනි ආයතනවලින් චර්ම රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය සහතිකපත් ලත් වෛද්‍යවරයෙකි. තවද ඔහු The Visible Difference නමැති ඉන්දීය සෞන්දර්ය විද්‍යාලයේ චර්මරෝග පිළිබඳ උපාධිධාරියෙකි.

වයස අවුරුද 30 ක් වන වෛද්‍ය නජීස්දීන් මහතා තම 15 වැනි වියේ සිට ආයුර්වේද වෛද්‍ය ක්‍රම හා පාරම්පරික වෛද්‍ය ක්‍රමවල නිරත වී සිටි නිසා අද වන විට ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ දක්ෂ විශේෂඥ වෛද්‍යවරයෙකු වශයෙන් චර්ම රෝග, දදය, ඇදුම, සුදු කබර, දියවැඩියාව, සුද යාම වැනි නිදන්ගත රෝගවලට පවා සාර්ථක ලෙස ප්‍රතිකාර කර රෝගීන් සුවපත් කරන්නේය.

අංක 82 නේට්ව් ආයුර්වේදික් හෝම් කලාවැව විජතපුර යන ලිපිනයෙහි තම වෛද්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන යමින් දිනපතා සියගණනක් රෝගීන්ට ප්‍රතිකාර කරන ඔහු ඊමේල් කූරියර වැනි සේවාවන් මගින්ද රෝගීන්ට අවශ්‍ය උපදෙස් දෙමින් වෛද්‍ය ක්‍රම පිළිබඳව පැහැදිලි කරයි.

පැරණි පුස්කොළ පොත් හා සියවස් 5කට පෙර වූ වෛද්‍ය ග්‍රන්ථ ආශ්‍රයෙන් වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමවල නිරත වන වෛද්‍ය නජීස්දීන් මහාත මේ සඳහා අවශ්‍ය ඖෂධ වර්ග ශ්‍රී ලංකාව තුළින් ද ඉන්දියාව පාකිස්ථානය වැනි රටවලින්ද ලබා ගනී.

චර්ම රෝගවලට බටහිර වෛද්‍ය ක්‍රමවලින් සාර්ථක ලෙස ප්‍රතිකාර කිරීමට නොහැකි යැයි පවසන ඔහු වර්තමානයේ බොහෝ දෙනෙකුට වධයක් ලෙස පවතින සුදුකබර රෝගය පිළිබඳව උපදෙස් සහ විග්‍රහයක් මෙහිදී ඉදිරිපත් කරයි.